# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 769 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 06/05/2024 පැය 1610

## මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.05.06 වන දින දහවල් කාලයේ බොරැල්ල පොලිස් වසමේ මැගසින් පාර, බොරැල්ල ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 480 ක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 22 ක් වන බොරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**11. මාරක රිය අනතුරක් - වැල්ලවාය පොලිස් වසම.**

2024.05.06 වන දින උදෑසන කාලයේ වැල්ලවාය පොලිස් වසමේ වැල්ලවාය තණමල්විල මාර්ගයේ කි.මී 310ත් 311ත් අතර අඳාවෙලයාය වත්ත ප්‍රදේශයේදී මාර්ගය අසල වැටී සිටි පුද්ගලයෙකු සිරිගල රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වැල්ලවාය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සිරිගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මෙම මිය ගිය පුද්ගලයා රිය අනතුරකින් මිය ගොස් ඇති බවට විමර්ශන වලදී අනාවරණය වී ඇති අතර රියදුරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වැල්ලවාය පොලිස් ස්ථානව විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**